චක්‍රලේඛ ලිපි අංක 02/2014

මගේ අංකය: විවැ/චක්‍රලේඛ ලිපි/2014
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2014- 09 - 17

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවීම සරල කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම</u>**

මවිසින් 2014- 08- 26 දිනැතිව නිකුත් කළ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 11/2014 පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රතිසංවිධානය කර බැංකු ක්‍රමය මගින් ගෙවීමේදී පහත සඳහන් කරන අඩුපාඩු නිරීක්ෂණය විය.

1. ගෙවීම් උපලේඛන නොයැවිය යුතු බවට ලබා දුන් උපදෙස් අනුගමනය කිරීමෙන් තොරව ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ගෙවීම් උපලේඛන (Pay outlet) බැංකු වෙත යැවීම.
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියෙහි ඇති විශ්‍රාමිකයන්ගේ බැංකු ගිණුම් අංකය හා නම බැංකුවල ඇති ගිණුම් අංකය හා නම අතර වෙනසක් තිබීම සහ හිස්ව තිබීම.
3. බැංකු ශාඛා සංකේත (Bank Codes) නිවැරදිව සඳහන් නොකිරීම.
4. ශුද්ධ විශ්‍රාම වැටුප සෘණ අගයක් ගැනීම සහ 0 ලෙස සඳහන් වීම.
5. මුළු විශ්‍රාම වැටුපට වඩා ශුද්ධ විශ්‍රාම වැටුප වැඩිවීම.
6. දත්ත පදනමෙහි විශ්‍රාමිකයාගේ නම සඳහන් නොවී ඒ වෙනුවට හිස්තැනක් තිබීම.
7. විශ්‍රාම වැටුප් අංකය වෙනුවට 0 හෝ භාවිතා නොවන අංක සඳහන් වීම.

2014 ඔක්තෝබර් 07 වන දින විශ්‍රාම වැටුප් ගෙවිය යුතු බැවින් ඉහත සඳහන් අඩුපාඩු කෙරෙහි විශේෂ අවධානය යොමු කර සම්පූර්ණ කරන ලද නිවැරදි දත්ත පදනම සැප්තැම්බර් මස 26 දිනට පෙර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

03. විගණකාධිපති